# වාර්ෂික වාර්තාව 2012

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය,
2වන මහල , බටහිර කුළුණ, සෙලින්කෝ මන්දිරය,
අංක 69, ජනාධිපති මාවත, කොළඹ 01
2013/02/06

ගරු කර්මාන්ත සහ වාණිජ අමාත්‍යතුමා,
කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය,
තැ.පෙ. 570, 73/1, ගාලු පාර,
කොළඹ 03

ගරු අමාත්‍යතුමනි,

**වාර්ෂික වාර්තාව 2012**

1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) උප වගන්තිය අනුව මම පහත ලේඛන ඉදිරිපත් කරමි.

01. 2012 වර්ෂය සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව.

02. 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ප්‍රකාශය සහ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය.

03. විගණකාධිපති වාර්තාව

මෙයට, විශ්වාසී,



**එන්.එම්.ෂහීද්**
සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

දැක්ම

**"ජාතියේ ආර්ථික, දේශපාලනික සහ සමාජයීය අභිලාෂයන් උදෙසා දායක වන්නා වූ ක්‍රියාශීලී , චිරස්ථායි සහ තරඟකාරී ව්‍යවසාය අංශයක් ගොඩනැංවීම"**

**"ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයෙහි අවශ්‍යම අංගයක් ලෙස ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියෙහි ව්‍යවසායයන්ගේ සංවර්ධනය, වැඩීම සහ තරඟකාරී බව සඳහා පහසුකම් සැපයීම සහ සක්‍රිය ලෙස ඒවාට උපකාර කිරීම"**

මෙහෙවර

## ජාතික ව්‍යාසාය සංවර්ධන අධිකාරියේ පරමාර්ථයන්

- ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා ආයෝජනයන් කිරීම, උනන්දු කරලීම් හා පහසුකම් සැපයීම තුලින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය වර්ධනය කිරීම, පුළුල් කරලීම හා සංවර්ධනය සඳහා උනන්දු කරලීම

- ශ්‍රී ලංකා භූමියෙන් බැහැරව ව්‍යවසායන් ඇති කිරීම හා ක්‍රියාත්මක කරලීම උනන්දුවක් ඇති කිරිම හා රුකුල් දීම කරමින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරි පනතේ සඳහන් පරමාර්ථ වන විදේශිය වෙළඳපල වෙත ප්‍රවේශ විය හැකි දේශීය ව්‍යවසායන් ජාත්‍යන්තර තලයට ගෙන ඒම.

- යථාවත් ලෙස සැකසූ ප්‍රතිපත්ති, සැළසුම්, ප්‍රවර්ධනාත්මක දිරිදීමනා සැකසීම හා කර්මාන්ත/ කෘෂිකර්මය වැඩිදියුනු කරලීම සහ වෙළදාම සඳහා පූර්ණව සහාය දැක්වීම/ ප්‍රවර්ධන පියවර ගැනීම

- ව්‍යවසාය සංවර්ධනයේ අත්‍යවශ්‍ය අංගයක් වන තාක්ෂණ කුසලතා ඇති කරමින් මානව ප්‍රාග්ධන සංවර්ධනය සහිත ජනයා වඩ වඩාත් ශක්තිමත් කරලීම.

- සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය කරන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

- ව්‍යවසාය සංවර්ධනය හා කරගෙන යාමට ව්‍යවසායකයන් හට මූල්‍ය පහසුකම් සඳහා වන ප්‍රවේශය පහසු කරලීම.

- නිෂ්පාදන සංවර්ධනය, තාක්ෂණය උසස් කිරීම සහ පේටන්ට් බලපත්‍ර සම්බන්ධයෙන් පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණ සංවර්ධන අරමුදලක් පිහිටුවීම.

- ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය සඳහා පහසුකම් ඇති කරලීම.

අධ්‍යක්ෂ මණ්ඩලය

**2012**

01. එම්.එස්.එස්. අමීර් අලි මහතා
සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්

02. එම්.ඒ. තාජුදීන් මහතා
අතිරේක ලේකම්- කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය
**MOIC**හි ලේකම් නියෝජනය කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

03. ටී.එන්.ඔෂාන් මහතා
අධ්‍යක්ෂ – රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව,
මුදල් අමාත්‍යාංශය
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

04. පූජ්‍ය ඇල්පිටියේ සුගුනකීර්ති හිමි
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

05. ඒ.එල්. මොහමඩ් හලීක් මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

06. එස්. ලක්ෂ්මන් මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

07. එන්.එම්.ෂහීඩ් මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

08. එම්.ඒ.සී.එම අමීන් මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

09. එස්. හේරත් මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

**වාර්ෂික වාර්තාව - 2012**

**සංවර්ධන වැඩසටහන**

**1.0 කුඩා හා මධ්‍යම ප්‍රමාණ ව්‍යවසාය ප්‍රතිපත්තිය**

**1.1** ව්‍යවසායකයන් ගේ ප්‍රශ්න / ගැටළු විසඳීම සඳහා වන ආයතනික යාන්ත්‍රණය

**1.1.1** ව්‍යවසාය සංසදය සහ දිස්ත්‍රික් ව්‍යවසාය සංසදය

**1.1.2** කුඩා හා මධ්‍යම ප්‍රමාණ ව්‍යවසායකයන් ගේ මාර්ගෝපදේශ ග්‍රන්ථය සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් ගේ නාමාවලිය

**1.1.3** දත්ත පද්ධතිය සහ වෙබ් අඩවි සංවර්ධනය

**1.2** කුඩා හා මධ්‍යම ප්‍රමාණ ව්‍යවසාය ප්‍රතිපත්තිය සකස්කිරීම සහ ක්‍රියාත්මක කිරීම

**2.0 අලෙවිකරණය, ව්‍යවසායකත්වය සහ ව්‍යවසාය සංවර්ධනය**

**2.1** ගමට ඔබින ව්‍යාපාර වැඩසටහන

**2.2** ශ්‍රීලංකා ව්‍යවසායකයන් ගේ කුසලතාව ගොඩනැගීම

**2.3** ව්‍යාපාර සංවර්ධන සේවා ප්‍රදර්ශන

**2.4** දේශීය ව්‍යාපාර ජාත්‍යන්තරකරණය සහ නූතන තාක්ෂණයට සහ අමුද්‍රව්‍ය වලට ඇති ප්‍රවේශය වැඩි දියුණු කිරීම

**2.5** භූගෝලීය පොකුරු සංවර්ධන වැඩ සටහන

**2.5.1** මොරටුව දැව පර්ෂද සංවර්ධන වැඩ සටහන

**2.5.2** කොහුබත් පර්ෂද සංවර්ධන වැඩ සටහන

**2.5.3** අත් යන්ත්‍ර පර්ෂද සංවර්ධන වැඩසටහන

**2.6** උපාධිධාරී ව්‍යවසායක උදානය වැඩසටහන

**2.7** දේශීය ගිණිකූරු නිෂ්පාදන ප්‍රවර්ධනය

**2.8** තාක්ෂණික සංවර්ධන අරමුදල

**2.9** තාක්ෂණ හුවමාරුව

**2.10** විද්‍යුත් මධ්‍යය හරහා ව්‍යවසාය අධ්‍යාපනය

**2.11** පාසැල් තරඟ

**2.12** දැයට කිරුළ ජාතික ප්‍රදර්ශණය

**2.13** දිවිනැගුම ජාතික වැඩසටහන

**2.14** කුඩා හා මධ්‍යම පරිමාණ ආධාරක සේවා

## කුඩා හා මධ්‍යම ප්‍රමාණ ව්‍යවසාය ප්‍රතිපත්තිය

1.1 ව්‍යවසායකයන් ගේ ප්‍රශ්න / ගැටළු විසඳීම සඳහා වන ආයතනික යාන්ත්‍රණය "ශ්‍රීලාංකික ව්‍යවසායකයන් ජාලගතකිරීම කරා"

1.1.1 දිස්ත්‍රික් ව්‍යවසාය සංසදය

1.1.2 ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ ඒකාබද්ධ සැළැස්මට අනුව, ගැටළු විසඳීමේ අරමුණෙන් දිස්ත්‍රික් මට්ටමින් ව්‍යාපාරික ගැටළු හඳුනා ගැනීම, ප්‍රතිපත්ති සකස් කිරීමේදී භාවිතා කිරීම සහ දිස්ත්‍රික්ක ව්‍යවසාය සංසද ස්ථාපික කිරීම ඊට ඇතුලත් වේ. දිස්ත්‍රික් ව්‍යවසාය සංසදය දිස්ත්‍රික් මට්ටමින් ස්ථාපිත කරනු ලබන අතර දිස්ත්‍රික්කය තුළ රාජ්‍ය හා රාජ්‍ය නොවන ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්, මණ්ඩල සහ වෙළඳ හෝ ව්‍යාපාර සංගම්වලින් එය සමන්විත වේ.

**වැඩසටහනේ අරමුණු:**

1. දිස්ත්‍රික් මට්ටමින් ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් අතර සම්බන්ධතාවය ගොඩනැගීම.
2. රාජ්‍ය හා පෞද්ගලික සංවාද සඳහා පහසුකම් සැපයීම.
3. දිස්ත්‍රික් ව්‍යවසාය සංසදය සහ කුඩා හා මධ්‍යම ප්‍රමාණ ව්‍යවසාය සංගම් අතර විධිමත් සම්බන්ධීකරණයක් ඇති කිරීම.
4. දිස්ත්‍රික් ව්‍යවසාය සංසදය හරහා ව්‍යවසායකයන්ට ව්‍යාපාර සංවර්ධන සේවා සැපයීම සඳහා ක්‍රමවේදයක් ඇති කිරීම.
5. දිස්ත්‍රික් මට්ටමේ සංසද වල නොවිසඳුනු ව්‍යාපාරික ගැටළු රැස්කර ජාතික ව්‍යවසාය සංසදයට ඉදිරිපත් කිරීම.

### 1.1.2.කුඩා හා මධ්‍යම ප්‍රමාණ ව්‍යවසායකයන් ගේ මාර්ගෝපදේශ ග්‍රන්ථය සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් ගේ නාමාවලිය

**"සියළුම ව්‍යවසායකයන් සඳහා තොරතුරු"**

ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්න්ගේ ජාතික නාමාවලියක් ප්‍රකාශයට පත්කිරීම සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් ශක්තිමත් කිරීම

ව්‍යවසාය සංවර්ධනය සඳහා සේවා සැපයීමේදී ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ට වැදගත්කාර්යභාරයක් හිමිවේ. විවිධ ආකාරයේ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් කුඩා හා මධ්‍ය ප්‍රමාණ අංශ සංවර්ධනයට සම්බන්ධවී සිටින අතර, ප්‍රධාන වශයෙන් අලෙවිකරණය, තාක්ෂණ සංවර්ධනය හා හුවමාරුව, මූල්‍ය, ව්‍යවසායකත්ව සංවර්ධනය, තොරතුරු තාක්ෂණ යනාදියන් සහයෝගය දක්වති. ඒකාබද්ධ සැළැස්මට අනුව රටපුරා විසිරී සිටින ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් ගැන ව්‍යවසායකයන් අතර දැනුවත් කිරීම ඉහළ නැංවීමේ අරමුණින් ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් ගේ ජාතික නාමාවලියක් සකස්කර ප්‍රකාශයට පත්කිරීමට වර්තමානයේදී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සම්බන්ධවී සිටී.

### කුඩා හා මධ්‍යම පරිමාණ මාර්ගෝපදේශක ග්‍රන්ථය

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය 2010 වර්ෂයේදී කුඩා හා මධ්‍යම පරිමාණ මාර්ගෝපදේශ ග්‍රන්ථය හඳුන්වාදුන් අතර, එය 2011-2012 වර්ෂවලදී සමාලෝචනයට ලක් කරන ලදී. වර්තමානයේදී එය ත්‍රෛයිභාෂික ස්වරූපයෙන් ලබාගත හැකිය. ජාතික මට්ටමේ මාර්ගෝපදේශ ග්‍රන්ථය දොරට වැඩීම 2012 වර්ෂයේදී සිදුකරන ලදී. එසේම, දිස්ත්‍රික්ක 05 දොරට වැඩීමේ වැඩ සටහන් පවත්වන ලදී.

## 1.1.3. දත්ත පද්ධතිය සහ වෙබ් අඩවි සංවර්ධනය

රටතුල කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අංශයට සේවය සැපයීම සඳහා සංනිවේදනය කිරීමේ ප්‍රවේශයක් වශයෙන් මෙම වෙබ් අඩවිය වැදගත් කාරයභාරයක් ඉටු කරයි. එය ව්‍යාපාර / ව්‍යවසායකයන්ට අදාළ තොරතුරු ලබාදෙන ඉතා දියුණු සහ පහසු මාර්ගයක් වේ.

ඊ- පාලන ප්‍රතිපත්තියට සම්පූර්ණයෙන් අනුකූලවන්නා වූ නව වෙබ් අඩවියක් ඇති කිරීම සඳහා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ ආයතනය යටතේ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ලියා පදිංචිවී ඇත.

මානව සම්පත්, තාක්ෂණය පවත්නා ව්‍යාපාරවල අනෙකුත් අවශ්‍යතා වැනි උවමනාවන් හඳුනාගැනීම සඳහා යාවත්කාලීන කරනුලැබූ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය දත්ත පද්ධතිය ඉතා වැදගත් වේ. විශේෂයෙන් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අංශය සඳහා යාවත්කාලීන දත්ත පද්ධතියක් රටතුල නොමැත.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය, එහි ධාරිතාවය සහ ගුණාත්මක බව මෙන්ම තොරතුරු වලට ප්‍රවේශවීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා ප්‍රතිව්‍යුහගත කරන ලදී. වර්තමානයේදී පාඨකයන් 390 ක් පමණ මෙම වෙබ් අඩවියට දිනපතා ඇතුල්වේ. මසකට ව්‍යවසායකයන් 50 සිට 60 දක්වා වෙබ් අඩවිය තුළ ලියාපදිංචි වේ.කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය මාර්ගෝපදේශ ග්‍රන්ථය ත්‍රෛභාෂිකව ලබා ගැනීමට ඉඩ සලස්වා ඇත.

## 1.2. කුඩා හා මධ්‍යම ප්‍රමාණ ව්‍යවසාය ප්‍රතිපත්තිය සකස්කිරීම සහ ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකාව තුළ සිටින කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන්ට සහයෝගය ලබාදීම සහ ඔවුන් දිරිමත් කිරීම සඳහා 2006 අංක 17 දරණ පණත යටතේ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පිහිටුවන ලදී. පණතට අනුව කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති සැකසීම එහි එක් අරමුණක් වේ. පණතේ 13 වන වගන්තියෙන් දක්වන පරිදි මෙම අධිකාරියේ සහ උප අංශයේ (ඇ) අරමුණු පහත සඳහන් පරිදි වේ.

**''ප්‍රත්පත්ති, සැළසුම් සකස් කිරීම, උසස්කිරීම සඳහා වන දිරිගැන්වීම් යෝග්‍ය පරිදි සැළසුම් කිරීම සහ කර්මාන්ත සහ කෘෂිකර්මාන්තය තුළ වෙළඳාමට සහ සංවර්ධනයට පලදායී ලෙස සහයෝගය දැක්වීම සහ ප්‍රවර්ධනය කිරීම''**

කර්මාන්ත හා වෙළඳ අමාත්‍යාංශය මගින් ලබාදී ඇති උපදෙස්වලට අනුව ප්‍රතිපත්ති වෙනුවෙන් පෙනී සිටීම සඳහා වූ ක්‍රියාකාරී කණ්ඩායමේ නම 2012 වර්ෂය ආරම්භයේදී ව්‍යවසාය සංසදය යනුවෙන්

වෙනස් කරන ලදී. එකී නම වෙනස් කිරීමත් සමග පද්ධතිය ද ප්‍රාදේශීය ව්‍යවසායකයන් සම්බන්ධ කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දෙන ලදී. 2012 වසරේදී ගැටළු ලැයිස්තුවක් සහ ලබාදෙන ලද විසඳුම් පවත්වාගෙන යාම සඳහා ආසියානු පදනම සමග සහයෝගයෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ගැටළු පෙන්වාදෙන්නෙකු සකස්කරන ලදී.

## 2.0 අලෙවිකරණය, ව්‍යවසායකත්වය සහ ව්‍යවසාය සංවර්ධනය

**"ව්‍යවසායකත්ව සංස්කෘතියක් වර්ධනය කිරීම හරහා ශ්‍රී ලාංකික නිෂ්පාදනයක් කරා යොමුවීම"**

## 2.1 ගමට ඔබින ව්‍යාපාර වැඩසටහන

කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය, ආර්ථික සංවර්ධනයේ ප්‍රධාන සාධක වශයෙන් හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවේ බහුතර ජනතාවක් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන අතර, එය මුළු ජනගහනයෙන් 78% ක් ලෙස තක්සේරුකර ඇත. ප්‍රදේශීය ස්ථානවල ඇති කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන් සේවා නියුක්තියේ සහ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අංශ සංවර්ධනයේ ප්‍රධාන ප්‍රභවය වේ. අනිකුත් රටවල් වලට සාපේක්ෂව මෙම අංශය අපේක්ෂිත මට්ටමේ දායකත්වයක් සාක්සාත්කරගෙන නොමැති බව පැහැදිලි වේ.

විශේෂයෙන් ප්‍රාදේශීය ප්‍රදේශවල කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අංශය ප්‍රවර්ධනය කිරීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සැළසුම්කර ඇති අතර, ග්‍රාමීය මට්ටමෙන් ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා "ගමට ඔබින ව්‍යාපාර වැඩසටහන" යනුවෙන් එය නම්කර ඇත. මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව, රටේ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අංශය දියුණු කිරීම සඳහා විශේෂ වැදගත්කමක් ලබාදී ඇත.

### ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන:

**තෝරාගත් ප්‍රතිලාභීන් ගේ හැකියාවන් සහ අනාගත අරමුණු අනාවරණය කරගනු පිණිස අවස්ථාව ලබා දෙමින් ඔවුන් ගේ ව්‍යවසායකත්ව කුසලාතාවයන් දියුණු කිරීමට මෙම පුහුණු වැඩ සටහන් මගින් වැඩි අවධානයක් යොමු කෙරේ. මෙම තෝරාගත් ප්‍රතිලාභීන්ට**

- ව්‍යවසායකයකු වශයෙන් ආත්ම විශ්වාසය දියුණු කර ගැනීම.
- මූල්‍ය හැකියාව වැඩි දියුණු කිරීම.
- ව්‍යාපාර සැළසුම් කිරීමේ කුසලතා සහ කළමණාකරන හැකියාවන් ලබාදීම කෙරෙහි අවධානය යොමුකරන්නා වූ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුවක් ලබාදෙනු ඇත.

### ව්‍යාපාර සැළසුම්වලට මුදල් යෙදවීම:

යෝජිත ව්‍යාපාර සැළසුම් සඳහා මූල්‍යමය සහයෝගය අවශ්‍යවන අවස්ථාවක ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් මුදල් ආධාරයක් ලබාදීම හෝ බැංකු ණයක් ලබාගැනීමට පහසුකම් සපයයි.

## ව්‍යාපාරවල තාක්ෂණික වැඩි දියුණු කිරීම්:

තාක්ෂණික හුවමාරු වැඩසටහන් සැළසුම්කර ක්‍රියාත්මක කරනු ලැබේ. තව ද, පර්යේෂණ හා සංවර්ධන සංවිධානවලට කෙෂ්ත්‍ර නිරීක්ෂණ චාරිකා සංවිධානය කරනු ලැබේ. වැඩසටහන් සැළසුම් කරන විට පහත දක්වා ඇති තාක්ෂණික බාණ්ඩ මේ සම්බන්ධයෙන් ඉතා වැදගත් වේ.

- මිනිසාට අදාළ හැකියා සංවර්ධනය (ප්‍රධාන වශයෙන් තාක්ෂණික හැකියාවන්)
- නව තාක්ෂණික ක්‍රියාවලීන් හඳුන්වා දීම.
- නව යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ හඳුන්වා දීම.
- නිෂාපාදනය, සංවර්ධනය හා ප්‍රවර්ධනය.
- පලදායිතාවය සහ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම.

## අලෙවිකරණ සංවර්ධනය:

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහයෝගය ඇතිව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් පුහුණු වැඩ සටහන් කෙෂ්ත්‍ර නිරීක්ෂණ සංවිධානය කරනු ලබයි.

- යෝජනා සැළසුම් කිරීම.
- අලෙවිකරණ හැකියාවන් සංවර්ධනය කිරීම.
- ප්‍රවර්ධන අමුද්‍රව්‍ය සැළසුම් කිරීම.
- ප්‍රවර්ධන වැඩසටහන් සැළසුම් කිරීම.

## ව්‍යාපාර උපදේශනය සහ කාර්යයන් පසු විපරම් කිරීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ/ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් ගේ සහයෝගය ඇතිව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපාර උපදේශනය සහ කාර්යයන් පසු විපරම් කිරීම සිදුකරනු ලබයි.

2012 වර්ෂයේදී තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සහයෝගය ඇතුව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් වැඩසටහනේ 02 වන සංරවකය ක්‍රියාත්මක කරන ලදී. ප්‍රාදේශීය ලෙප්කම් කාර්යාල හරහා ප්‍රතිලාභීන් හඳුනාගනු ලබන අතර, මන්නාරම, මඩකලපුව සහ කුරුණෑගල යන දිස්ත්‍රික්ක වලින් ප්‍රතිලාභීන් 140 දෙනකු හඳුනා ගන්නා ලදී. එසේ හඳුනාගනු ලැබූ ප්‍රතිලාභීන්ට ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව ලබදුන් අතර, ස්වකීය ව්‍යාපාර ස්ථාපිත කර ගැනීමට සහ පුළුල් කර ගැනීමට සහයෝගය ලබාදී ඇත.

එසේම, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 50 ගෙන් සමන්විත ව්‍යවසායකයන් 119 දෙනෙකුට, මන්නාරම දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 29 දෙනකුට ගම්පහ සදිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 10 දෙනෙකුට සහ මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 30 දෙනෙකුට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් මූල්‍ය ආධාර ලබාදී ඇත.

## අංශ සංවර්ධන වැඩසටහන:

**මල්වැවීමේ අංශය:**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ දේශීය තරඟකාරී වාසි වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදී. මල් වැවීමේ අංශය වයඹ පළාතේ තරඟකාරී ව්‍යාපාර අංශවලින් එකක් බව හඳුනාගෙන ඇත. එමනිසා අදාළ පාර්ශව කරුවන් ගේ සහයෝගය ඇතුව කර්මාන්ත සහ වෙළඳ අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍ය ගරු ජයරත්න හේරත් මහතාගේ සහභාගිත්වයෙන් වයඹ පළාත තුළ මල් වගාකිරීමේ අංශ සංවර්ධන වැඩසටහනක් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක නරන ලදී.

**වැඩමුළුවේ අරමුණු:**

- පවත්නා ගැටළු සහ යෝජනාකර ඇති විසඳුම් හඳුනා ගැනීම.
- අදාළ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවල සේවා පිළිබඳ වැවිලිකරුවන් සහ අනෙකුත් පාර්ශවයන් දැනුවත් කිරීම.
- පර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය.
- අංශ සංවර්ධන වැඩ සටහන් සඳහා ක්‍රියාකාරී සැළැස්මක් සකස් කිරීම පිණිස තොරතුරු රැස් කිරීම.

2012 වර්ෂය වයඹ පළාත තුළ මල්වැවිලි කරුවන් 107 දෙනකු සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩ සටහන් පවත්වා ඇත.

## 2. පසුවිපරම් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ අදියර:

පසුවිපරම් කිරීමේ වැඩසටහන යෝජනා පදනම්කරගෙන දිස්ත්‍රික් ව්‍යවසාය සංසදය හරහා සිදුකරනු ඇත.

### 2.2 ශ්‍රීලංකා ව්‍යවසායකයන් ගේ ශක්‍යතා වර්ධනය:

**"කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසය තරගකාරිත්වයක් කරා මානව හැකියාවන් වඩා වැඩි දියුණු කිරීම"**

**ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්, ව්‍යවසායකයන් සහ ව්‍යාපාර සංගම් වල ශක්‍යතා සංවර්ධනය**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ශ්‍රීලංකා ව්‍යවසායන් ගේ සංවර්ධනය වර්ධනය සහ තරගකාරිත්වය උදෙසා පහසුකම් සපයන අතර, ස්වකීය නිපුණතාවය සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ට සේවා සපයයි. ශ්‍රීලාංකික ව්‍යාපාර සේවා සපයන්නන් පිළිබඳව අවශ්‍යතා තක්සේරුවක් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් සිදුකරන අතර, මානව සම්පත් වල හැකියාවන් වැඩිදියුනු කරයි.

## 2012 වසර දක්වා ප්‍රගතිය

| පුහුණුකිරීමේ වැඩසටහන් | දිස්ත්‍රික්කය / ප්‍රදේශය | ප්‍රතිලාභීන් සංඛ්‍යව |
|---|---|---|

| | | |
|---|---|---|
| **කාර්මික පුහුණුකිරීම්** | | |
| ආහාර සකස් කිරීම | මඩකලපුව | 151 |
| ඇඳුම් මැසීම | ත්‍රිකුණාමලය | 165 |
| **වෙනත් පුහුණුකිරීම්** | | |
| අලෙවිකරනය සහ පාරිභෝගිකයන් | පොළොන්නරුව | 35 |
| ගුණාත්මකභාවය සහ ඵලදායිතාවය | පුත්තලම | 35 |
| මානව සම්පත් කළමණා-කරනය | රත්නපුරය | 24 |
| මානව සම්පත් කළමණා-කරනය | පුත්තලම | 22 |
| නිෂ්පාදන පිරිවැය සහ මිල | අනුරාධපුරය | 25 |
| මානව සම්පත් කළමණා-කරනය | කුරුණෑගල | 30 |
| මානව සම්පත් කළමණා-කරනය | අනුරාධපුරය | 29 |
| මූල්‍යමය තීරණ ගැනීම, බදුකරණය සහ ගිණුම් කරණය | කුරුණෑගල | 36 |
| **කෙටිකාලීන පුහුණු වැඩසටහන්** | | |
| පොත්තැබීම සහ ගිණුම් කරණය | පොළොන්නරුව | 35 |
| ඇඳුම් මැසීම | ත්‍රිකුණාමලය | 44 |
| අලෙවිකරණය | කුරුණෑගල | 32 |
| තල් නිෂ්පාදනය | මන්නාරම | 35 |
| කිරිපට්ටි කළමණාකරනය | කුරුණෑගල | 25 |
| නෛතික පරිසරය සහ මූලික ව්‍යාපාර නියමයන් | සේරු නුවර | 24 |
| | රම්බොඩ | 17 |
| | කොණ්ඩවිල් | 23 |
| | කිළිනොච්චිය | 33 |
| | මඩකලපුව | 64 |

| | | |
|---|---|---|
| | අම්පාර | 22 |
| මූලික ගිණුම් සහ වාර්තා තැබීම | හලාවත | 30 |

**2.3 ව්‍යාපාර සංවර්ධන සේවා වෙළඳ ප්‍රදර්ශණ:**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංයුක්ත සැලැස්මට අනුව (යොමු අංකය: 3.4.1), කලාපීය මට්ටමින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මෙහෙයුම් වැඩි දියුණු කිරීම පිණිස ව්‍යාපාර වෙළඳ ප්‍රදර්ශණ සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් ගේ සේවා ප්‍රදර්ශණ පැවැත්වීමට යෝජනා කරනු ලබේ.

**අරමුණු:**

I. ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් සහ මධ්‍යම හා කුඩා පරිමාණ ව්‍යසායකයන් අතර ඇති පරතරය පිරවීම (MSMES).

II. කුඩා හා මධ්‍යම පරිමාණ සංවර්ධනය සඳහා ව්‍යාපාර ජාලයක් සංවර්ධනය කිරීම.

III. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් ගේ නිෂපාදන ප්‍රදේශය තුළ ප්‍රවර්ධනය කිරීම සහ අලෙවිකරන සම්බන්ධතා සථාපිත කිරීම.

2012 වර්ෂයේදී ජාතික ව්‍යවසාය සදංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපාර සංවර්ධන සේවා ප්‍රදර්ශණ හතරක් (04) කුරුණෑගල , මඩකලපුව මන්නාරම සහ අනුරාධපුර යන දිස්ත්‍රික්කවල පවත්වා ඇත.

**2.4 දේශීය ව්‍යාපාර ජාත්‍යන්තරකරණය:**

දේශීය ව්‍යාපාර ජාත්‍යන්තරකරණය කිරීම ආරම්භ කිරීමේ මුල් පියවර වශයෙන්, ජාතික ව්‍යාපාර සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපාර දූත මණ්ඩලයක් ලෝකයේ ප්‍රමුඛ පෙලේ ජාත්‍යන්තර තාක්ෂණ ප්‍රදර්ශණ වලට යැවීම සඳහා සංවිධානය කරන ලදී.

2012 වර්ෂයේදී ජාතික ව්‍යාපාර සංවර්ධන අධිකාරිය විසින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ වාණිජ මණ්ඩලයේ සහයෝගය ඇතිව සාමාජිකයින් 37 කින් සමන්විත ව්‍යාපාර දූත මණ්ඩලයක් චීනයේ ගොන්ශෝයි හි පැවති ආනයන අපනයන භාණ්ඩ ප්‍රදර්ශණය සඳහා යැවීමට කටයුතු කර ඇත.

**2.2 පර්ෂද සංවර්ධන වැඩසටහන:**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් පවත්නා කර්මාන්ත සමූහය හඳුනාගනු ලබන අතර, නිශ්චිත සමූහයක වටිනාකම් දාමය සහ භූගෝලීය ප්‍රදේශය හඳුනාගන් ලබයි. ඒ අනුව එම පර්ෂද ව්‍යාපාර කටයුතු වැඩි දියුනු කිරීම සඳහා මැදිහත් වේ. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරි පනත යටතේ විශේෂ ආර්ථික කලාපයක් වශයෙන් සංවර්ධනය කිරීම සඳහා ඉහළ සංවර්ධන ශාක්‍යතාවයකින් යුතු පොකුරු තෝරාගනු ඇත. දැනට මොරටුව දැව පර්ෂද, වයඹ කොහුබත් සහ නැගෙනහිර පළාතේ අත්යන්ත්‍ර පර්ෂද ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගත් පර්ෂද වේ.

අරමුණු:

I.අලෙවිකරණ සම්බන්ධතා ස්ථාපිත කිරීම.
II.තාක්ෂණික සම්බන්ධනය සහ හුවමාරුව.
III.ව්‍යවසායකත්ව සංවර්ධනය.

IV. මූල්‍ය සහයෝගිතාවය.
V. යටිතල පහසුකම් සංවර්ධනය.

**2.5.1 මොරටුව දැව පර්ෂද සංවර්ධන වැඩසටහන:**
**ජාත්‍යන්තර මට්ටමේ තරඟකාරී ගෘහභාණ්ඩ දේශීයව නිෂ්පානය කිරීම"**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් අවිධිමත් භූගෝලීය පොකුරක් වශයෙන් මොරටුව හඳුනාගෙන ඇති අතර සංවර්ධන හවුල්කරුවන්ගේ සහයෝගය ඇතිව කාර්මික ගම්මාන සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ රජය විසින් දැනටමත් ආරම්භ කර ක්‍රියාත්මක කරන සංවර්ධන කටයුතු පුළුල් කිරීම මගින් එය සංවිධානාත්මක පොකුරක් වශයෙන් සංවර්ධනය කිරීමට සැළසුම්කර ඇත.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් මොරටුව දැව කර්මාන්ත සංගමය හරහා ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මොරටුව දැව කර්මාන්ත සංගමයේ සහයෝගය ඇතිව ප්‍රතිලාභීන් තෝරාගනු ලැබූ අතර, ප්‍රතිලාභීන් 25 දෙනකු සඳහා ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහනක් පවත්වන ගදී. එසේම, වඩු කර්මාන්තයේ නියැලී සිටින ව්‍යවසායකයන් 25 දෙනෙකු වෙනුවෙන් යන්ත්‍ර සහ උපකරණ සපයන ලදී.

ඊට අමතරව පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කරන ලදී.

1. මොරටුව පර්ෂද සංවර්ධනය සඳහා විශේෂ දත්ත පද්ධතියක් සකස් කිරීම.
2. වෙළඳ හා වාණිජ අමාත්‍යාංශයේ විශේෂ ආර්ථික කලාපයක් වශයෙන් මොරටුවේ දැව පර්ෂද ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශනය ගැසට් නිවේදන කෙටුම්පත් කිරීම.
3. විවිධ ප්‍රදේශ වල කුඩා ගෘහභාණ්ඩ ප්‍රදර්ශන පැවැත්වීම.
4. ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**2.1.1 කොහු කර්මාන්ත පර්ෂද සංවර්ධන වැඩසටහන:**

වයඹ පළාතේ කොහු කර්මාන්තය රටතුළ ඇති ප්‍රධාන තරඟකාරී ව්‍යා ව්‍යාපාරවලින් එකකි.රටේ පොල් නිෂ්පාදනයෙන් 45% වඩා වැඩි ප්‍රතිශතයක් වයඹ පළාතෙන් සපයන අතර, රටේ කොහු ඇඹරුම්හල් වලින් 85% ක් ක්‍රියාත්මක වන්නේ වයඹ සහ බස්නාහිර පළාත් තුළය. ලෝක වෙළඳපොලට ඇතුළුවන නව තරඟකරුවන්, ආනයන ඇණවුම් ඉටුකරලීමේ අපහසුතා ගුණාත්මක බවෙන් අඩු කොහු, පොල්ළෙලි සැපයීම අඩුකම, අමුද්‍රව්‍ය ප්‍රවාහණය කිරීමේ තාක්ෂණික ගැටළු සහ කල් ඉකුත්වූ යන්ත්‍රෝපකරණ, අදාල පාර්ශවයන් අතර සම්බන්ධතා අසාර්ථක වී, සේවා වියුක්තියට පහළ දායකත්වය වැනි සමහර අභියෝග වලට මුහුණ දෙමින් පොල් ලෙල්ලෙන් මූලික අමුද්‍රව්‍ය ලබා ගන්නා පොල් කොහු කෙඳි කර්මාන්තය ලෝක වෙළඳපොල තුල තරඟකාරී තත්වයකට පත්වී ඇත.

යහපත් වැඩ කිරීමේ අභ්‍යාස පිළිබඳ වැඩමුළු 04 ක් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් පවත්වන ලද අතර, කොහු නිෂාපාදන කර්මාන්තශාලාව තුළ වැඩ කිරීමේ සහපත් පරිසරයක් නිර්මාණය කිරීම පිණිස සමාජ ආරක්ෂණ මණ්ජලය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ විශ්‍රාම වැටුප් ක්‍රමයක් ප්‍රවර්ධනය කරන ලද අතර, විවධ ප්‍රෙද්ශ නියෝජනය කරමින් කොහුමෝල් හිමියන 104 දෙනකු පමණ මෙම වැඩසටහනට සහභාගිකරගන්නා ලදී. ඊට අමතරව, කම්කරු රෙගුලාසි සහ බදුකරණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් කොහුමෝල් හිමියන් 80 දෙනෙකු වෙනුවෙන් පවත්වන ලදී.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් හම්බන්තොට දිස්ත්‍රික්කය තුල කොහු අංශයේ සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබූ අතර, හම්බන්තොට දිස්ත්‍රික්කයේ කොහු පදනම්කරගත් නිෂ්පාදකයන් 269 දෙනෙකුට ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව ලබාදෙන ලදී.

**2.1.2 අත්යන්ත්‍ර රෙදි වියන්නන්ගේ පර්ෂද සංවර්ධන වැඩසටහන:**

''දේශීය ඇඳුම් භාවිතා කරන සාඩම්බර පුරවැසියන් බිහිකිරීම සඳහා''

ජාතික ව්‍යවසාය සවර්ධන  අධිකාරිය විසින් අත්යන්ත්‍ර පර්ෂද සංවර්ධන වැඩසටහනේ නිරතව සිටී. මේ යටතේ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් පළමු වැඩසටහන පිළිවෙලින්  මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කවල  පලමුණෛයි සහ මරදමුණෛයි අත්යන්ත්‍ර රෙදිවියන පර්ෂද නගා සිටුවීමට ක්‍රියාත්මක කරන ලදී.

1. ජාතික ව්‍යවසාය සවර්ධන  අධිකාරිය විසින් පලමුණෛයි සහ මරතමුණෛයිහිදී විකුණුම්කරුවන්ගේ සහ අලෙවිකරුවන්ගේ රැස්වීමක් පවත්වන ලදී.කොළඹින් ගැනුම්කරුවන් 15 දෙනෙකු පමණ මෙම රැස්වීම්වලට සහභාගිවූහ. ජාතික ව්‍යවසාය සවර්ධන  අධිකාරිය විසින් මරතමුණෛයි සහ සහ පලමුණෛයි ප්‍රදේශවලදී ප්‍රතිලභීන් 90 දෙනෙකු සඳහා තාක්ෂණික සහ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

2. පෞද්ගලික සහ සංස්ථාගත අංශ සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්:

   ජාතික ව්‍යවසාය සවර්ධන  අධිකාරිය විසින් ඇඟලුම් සමූපාකාරවල සහ පෞද්ගලික අංශයේ නිලධාරීන් 50 දෙනෙකු වෙනුවෙන් ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් ලබාදෙන ලදී.

3. වාණිජ ව්‍යාපාර සඳහා විලාසිතා නිර්මාණය පිළිබඳ  විශේෂ උපාධිධාරීන් ප්‍රවර්ධනය කිරීම:

   උපාධිධාරීන් 15 දෙනෙකු වෙනුවෙන් විලාසිතා නිර්මාණය පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

4. අත්යන්ත්‍ර රෙදි වියන්නන් සඳහා යන්ත්‍රෝපකරණ සැපයීම:
   මඩකලපුව දිසත්‍රික්කයේ  යුදධයෙන් පීඩාවට පත් අත්යවන්ත්‍ර රෙදි වියන්නන් අතරේ අත්යන්ත්‍ර 70 ක් බෙදාදෙන ලදී.

## යන්ත්‍රෝපකරණ බෙදාහැරීම පිළිබඳ විස්තරය

| අංකය | විස්තරය | ගණන |
|---|---|---|
| 01 | අත්යන්ත්‍ර රෙදිවියන්නන් (පළාත - කල්ලඩි වේලර්,  ගන්ධිපුරම්, කුරුක්කුලමඩම්, කල්ලඩි මන්චන්තෝඩුවයි සංකීරණය, පුතුකුඩුරිප්පු,තුරෙයිනීලවනෙයි,මන්ගඩු, ආර්ට් ලයින් කල්ලඩි, ඉරුතයපුරම්, පෙරියකල්ලරු කලුතවලයි) | 38 |
| 02 | කාත්තන්කුඩි -  පලමුණෛයි අත්යන්ත්‍ර රෙදිවියන්නන්ගේ සංගමය, එස්.එන්.ඩී. පාර, අක්බාර් ටවුන්, නව කාත්තන්කුඩි - 06. | 13 |
| 03 | සමාජ හා ආර්ථික සංවර්ධන සංගමය, අංක 304,  කරියප්පාර් පාර. මරුතමුනෙයි- 06. | 04 |
| 04 | තුරනීලවනෙයි - අන්නා ප්‍රජා මධ්‍යස්ථානය,  තුරනීලවනෙයි. දකුණ 01. | 04 |
| 05 | ප්‍රාදේශීය සභාව, කෝරලෙයිපත්තු බටහිර, ඔඩ්ඩමවඩි. | 06 |
| 06 | ප්‍රාදේශීය ලේකම්, මධ්‍යම කෝරළෙයිපත්තු, වාලෙයිච්චනෙයි. | 05 |

| | | |
|---|---|---|
| | මුළු අත්යන්ත්‍ර සංඛ්‍යාව | **70** |

**5.අත්යන්ත්‍ර පිළිබඳ පාරිභෝගික සමීක්ෂණයට**

**කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය යටතේ ඇති පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද " රන්සළු 2012" අත්යන්ත්‍ර ප්‍රදර්ශණය සහ විලාසිතා දැක්මේදී** ජාතික ව්‍යවසාය සවර්ධන අධිකාරිය විසින් පාරිභෝගික සමීක්ෂණයක් පවත්වන ලදී.

**2.2** උපාධිධාරී ව්‍යවසායක උද්‍යානය වැඩසටහන:

''සේවා නියුක්තිය අපේක්ෂා කරන උපාධිධාරීන් සේවා නියුක්තිය සපයන උපාධිධාරීන් බවට පත්කිරීම - සාම්ප්‍රදායික චින්තන ක්‍රියාවලියෙන් මූලික වෙනස්වීම''

රැකියා විරහිත තරුණයන්ගේ ප්‍රමාණයේ අඛණ්ඩ ඉහළයාමක් ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සංඛ්‍යා දත්ත මගින් පෙන්වයි. මේ සඳහා එක විසඳුමක් වන්නේ ඔවුන්ගේම ස්වකීය ව්‍යාපාරයක නිරතවීමට ඔවුන්ව ධෛර්යමත් කරවීමයි. උපාධිධාරී ව්‍යවසායක උද්‍යානය වැඩසටහන මගින් ඔවුන්ව ව්‍යාපාරයක නිරත කිරීමට ධෛර්යමත් කිරීම මගින් උගත් තරුණ රැකියා සපයන්නන් බවට පත් කිරීමට ප්‍රයත්න දරමින් සිටි. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම මගින් ඔවුන් සාර්ථක ව්‍යවසායකයන් බවට සංවර්ධනය කිරීම සඳහා විශේෂ වැඩසටහන් දියත් කරන ලදී.

**අරමුණු:**

**1**.සාර්ථක ව්‍යවසායකයන් ගොඩ නැගීම
2. රැකියා අවස්ථා සැපයීම.
3.ව්‍යාපාරවල නිරතවීමට උගත් තරුණයන් ධෛර්මත් කිරීම.

**ප්‍රධාන කාර්යයන්:**

1. උපාධිධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
2. අයදුම්පත් එකතු කිරීම හා සම්මුඛ පරීක්ෂණ මගින් තෝරා ගැනීම.
3. අවශ්‍යතාවය ඇගයීම.
4. අවශ්‍යතාවය ඇගයීම පදනම්කරගෙන හැකියාවන් සංවර්ධනය.

- ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව
- තාක්ෂණික පුහුණව
- අනාවරණ චාරිකා
- අවශ්‍යතා පදනම්කරගත් වෙනත් පුහුණුකි'රීම්
- මූල්‍ය අවශ්‍යතාවන් වලදී සහයෝගය දැක්වීම.
- පසුවිපරම් කිරීම ව්‍යාපාර උපදේශනය.

මුල් අදියරේදී, ජාතික වන්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය විසින් වයඹ විශ්ව විද්‍යාලයෙන් උපාධිධාරීන් 26 දෙනෙකු තෝරාගෙන ඔවුන්ට ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව ලබාදෙන ලදී.

තෝරාගත් උපාධිධාරීන් 05 දෙනෙකු වෙනුවෙන් මූල්‍ය ආධාර සැපයීමට ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය විසින් සැළසුම්කර ඇත.

**1.2 දේශීය හඳුන්කූරු නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම:**

රේගු දෙපාර්තමේන්තුවේ ආනයන සංඛ්‍යාවලට අනුව ශ්‍රීලංකාව විසින් වාර්ෂිකව රුපියල් මිලියන 30 ක් වටිනා හඳුන්කූරු ප්‍රධාන වශයෙන් ඉන්දියාවෙන් සහ කුඩා ප්‍රමාණයක් තායිලන්තය ආදී රටවලින් ආනයනය කරන බව ජාතික වන්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය විසින් විමර්ෂණය කරන ලදී. න්‍යායාත්මකව ශ්‍රීලංකාව තුළ ආසන්න වශයෙන් හඳුන්කූරු නිෂ්පාදනය කිරීමේ ස්වයං රැකියා 25,000 ක් ඇති කිරීමට මේ මගින් මංපෙත් විවිර කරයි.

ජාතික වන්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය විසින් රටපුරා සිටින හඳුන්කූරු නිෂ්පාදකයන් 23 දෙනකුගෙන් සමන්විත හඳුන්කූරු නිෂ්පාදකයන්ගේ සංගමයක් පිහිටුවන ලදී. පහත සඳහන් ප්‍රතිපත්ති සහ සංවර්ධන තීරණ ගෙන ක්‍රියාත්මක කරන ලදී.
ආනායන සීමාව: ආනයන හඳුන්කූරු මත සෙස් බද්දක් පනවා ඇති අතර දැනට ආනයන හඳුන්කූරු කිලෝ එකක් සඳහා රු: 500/= ක සෙස් බද්දක් ක්‍රියාත්මක **වේ.**

**අමුද්‍රව්‍ය බහුලත්වය:**

උණ ගස් හඳුන්කූරු සෑදීමේ ප්‍රධාන අමුද්‍රව්‍යයක් වුව ද එය ඉතා වැදගත් සහ පාරිසරික විනාකමින් යුත් පැළයක් නිසා උණගස් කැපීමේ සහ ප්‍රවාහණය කිරීමේ ගැටළුයක් තිබේ. එසේම වැඩි වශයෙන් ගිණිකූරු කර්මාන්ත මධ්‍යම පළාතේ පිහිටා තිබේ. එමනිසා කෙටිකාලීන විසඳුමක් වශයෙන් හඳුන්කූරු කර්මාන්තයේ නිරතවී සිටින නිෂ්පාදකයන්ට පෞද්ගලික වතුවලින් උණගස් කැපීමට අවසර ලබා ගැනීම සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් පහසුකම් සපයා ඇත.

බදුල්ල දිස්ත්‍රික්කයේ කාන්තා සංගමයේ ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් හඳුන්කූරු නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණික පුහුණුවක් පැවැත්වූ අතර, ඒ සඳහා 28 දෙනෙකු සහභාගි විය. සහභාගිවූවන් ග්‍රාමීය ප්‍රදේශවලින් පැමිණි ඉතා දිළිඳු අය විය. අලෙවිකරණ සම්බන්ධතා සහ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය සොයා ගැනීම ඔවුන්ට තිබූ ගැටළු වේ. මේ වන විට පුහුණුවන්නන් විසින් නිෂ්පාදනය කරනු ලබන හඳුන්කූරු මිලදී ගැනීමට බොබී ඉන්ඩස්ට්‍රීස් ආයතනය ස්වකීය කැමැත්ත ප්‍රකාශකර ඇති අතර මෙම අංශයේ නව ව්‍යාපාර 28 ක් ස්ථාපිත කර ඇත.

IRSD හි ඉල්ලීම පරිදි අනුරාධපුර දිස්ත්‍රික්කයේ හඳුන්කූරු නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණික පුහුණුවක් පැවැත්වූ අතර ව්‍යවසායකයන් 20 දෙනෙකු ඊට සහභාගි විය.

**2.4 තාක්ෂනික සංවර්ධන අරමුදල:**

ස්වකීය ව්‍යාපාර ආරම්භක අවදියේ සිට වර්ධනය කිරීමට, ව්‍යාප්ත කිරීමට සහ ජාත්‍යන්තරකරණය කිරීමේ මට්ටම දක්වා සංවර්ධනය කිරීම සඳහා ව්‍යවසායකයන්ට තාක්ෂණික සහයෝගී සේවා සැපයීම සඳහා තාක්ෂණික සංවරධන අරමුදලක් පිහිටුවීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සැළසුම්කර ඇත. පහත සඳහන් කාර්යයන් සඳහා තාක්ෂණික සහ මූල්‍ය සහයෝගය ලබාදීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සැළසුම්කර ඇත.

I. නිෂ්පාදන ගුණාත්මකභාවය ඉහලනැංවීම සහ SME විසින් නිපදවනු ලබන නිෂ්පාදනවලට වටිනාකම් එකතු කිරීම සඳහා සහයෝගය ලබාදීම.

II. ආනයනය කරනු ලබන තාක්ෂණය සුදුසු වේ සකස්කර ගැනීම සඳහා පහසුකම් සැපයීම.

III. තාක්ෂණික ක්‍රියාවලිය සංවර්ධනයට සහයෝගය දැක්වීම.

IV. තාක්ෂණික සහයෝ දැක්වීම මගින් තාක්ෂණික සහපත් ව්‍යවසායකයන් ඇති කිරීම.

ශ්‍රීලංකාව තුළ තාක්ෂණික සංවර්ධන අරමුදලක් පිහිටුවීම සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරි පණතට සිදුකරන ලද විධි විධාන අනුව අමාත්‍යමණ්ඩල සටහනක් සකස්කර එය කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් තාක්ෂණික හුවමාරුව හරහා පර්යේෂණ වාණිජකරණය පිළිබඳ කාරක කණ්ඩායමක් ස්ථාපිත කරන ලදී. එසේම ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් මලයාසියානු තාක්ෂණික සංවර්ධන සහයෝගීතාවයෙන් තාක්ෂණික සහයෝගය ලැබාගැනීමේ හැකියාව පිළිබඳව අනාවරණය කරන ලදී.

## 2.5 තාක්ෂණික හුවමරුව:

කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන්ට ස්වකීය නිෂ්පාදන ගුණාත්මභාවය උසස් කිරීම සහ අවසාන වශයෙන් ගෝලීය ව්‍යාපාර පරිසරය තුළ තරඟ කිරීමට ඔවුන්ව පෙළඹවීම පිණිස නව සහ ප්‍රත්‍යක්ෂ වූ තාක්ෂණය ව්‍යාප්ත කිරීමේ උත්පේරක කාර්යභාරයක් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියට ඇත.2012 වසරේදී ආරම්භ කරන ලද තාක්ෂනික හුවමරාරු වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන්ට දේශීය පර්යේෂණ හා සංවර්ධන ආයතනවලට නව තාක්ෂණික සොයා ගැනීම්වලට ප්‍රවේශවීමට සහයෝගය ලබාදීමයි.

ඒ අනුව 2012 වසරේදී, තෝරාගත් ව්‍යවසායයෙකුට මේද ඇෂිඩ් සරුසාර බිත්තර නිෂ්පාදනය කිරීම පිළිබඳව තාක්ෂණය හඳුන්වා දීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ප්‍රථම ප්‍රයත්නය දරන ලදී. මෙම වැඩසටහන තුළ කාර්මාන්ත තාක්ෂණය විසින් නිපදවන ලද ඉහතකී තාක්ෂණය වැලිකන්දේ සීමාසහිත ආරෝග්‍යා පාම් පෞද්ගලික සමාගමට හඳුන්වා දෙන ලදී.

## 2.6 විද්‍යුත් මාධ්‍යය හරහා ව්‍යවසාය අධ්‍යාපනය (රූපවාහිනී අධ්‍යාපන වැඩසටහන):

ආරම්භයේ සිටම මෙම වැදගත් අංශය ප්‍රවර්ධනය කිරීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විවිධ පියවර ගෙන ඇත. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් විද්‍යුත් මාධ්‍ය හරහා ව්‍යවසාය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කරයි. මෙම වැඩසටහන රූපපවාහිණි සංස්ථාව සමඟ ක්‍රියාත්මක කරන මිනිත්තු 30 ක වැඩසටහනක් වන අතර, මසකට වරක් එය විකාසනය වේ.

**වැඩසටහනේ අරමුණු**:

1. ව්‍යවසායකයන්ට සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ට ව්‍යාපාරික තොරතුරු සැපයීම.
2. ව්‍යවසායකයන්ට සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් අතර ඇති පරතරය අවම කිරීම.
3. ව්‍යවසායකයන් අතර ආකල්පමය සහ ව්‍යවසායික සංස්කෘතියක් වර්ධනය කිරීම.
4. තාක්ෂණය හුවමාරු කිරීම.
5. ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් ගේ සේවා ප්‍රවර්ධනය කිරීම.
6. විවිධ කේෂ්ත්‍රවල ව්‍යාපාර දැනුම වැඩි දියුණු කිරීම.
7. ව්‍යවසායයන් විසින් මුහුණදෙන ගැටළු සඳහා විසඳුම් (ව්‍යවසායකයන්ට ස්වකීය ව්‍යාපාර ගැටළු ඉදිරිපත් කිරීමට අවස්ථාව ඇත).

විශේෂ තේමාවන් යටතේ 2012 වසරේදී රූපවාහිණි වැඩසටහන් 06 ක් විකාසනය කර ඇත.

## 2.12 " දැයට කිරුළ" ජාතික ප්‍රදර්ශනය:

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ''දැයට කිරුළ'' ප්‍රදර්ශණයට සහභාගීවූ අතර, එහිදී කුටියක් පවත්වාගෙන යන ලදී. 2013 දැයට කිරුළ වැඩසටහන යටතේ අම්පාර, මඩකලපුව, පොළොන්නරුව දිස්ත්‍රික්කවල සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය බලාපොරොත්තුවේ.

මෙම ජාතික වැඩසටහන සඳහා පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කිරීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සැළසුම්කර ඇත.

1. ඉහත එක් එක් දිස්ත්‍රික්කවලින් (එක් දිස්ත්‍රික්කයක් සඳහා 30 දෙනෙකු) සමජාතිය නව හෝ පවත්නා ව්‍යාපාර කණ්ඩායම් තෝරාගැනීම සහ ව්‍යාපාරික පුහුණුව( එක් දිස්ත්‍රික්කයක සඳහා එක් වැඩසටහනක්) ලබාදීම. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ අදාළ ප්‍රදේශයේ අනෙකුත් ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් මගින් තෝරා ගැනීම සිදුකෙරෙනු ඇත.
2. ස්වකීය මූල්‍ය අවශ්‍යතා සඳහා මූල්‍ය ආයතන සමඟ සම්බන්ධවීම.
3. ප්‍රදේශය තුල ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් සමඟ සහයෝගය ඇතිව සිදුකරන සේවා පසුවිපරම් කිරීම.

## 2.13 ''දිවි නැගුම'' ජාතික වැඩසටහන:

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සහ සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යාපාර ස්වර්ධන අමත්‍යාංශය විසින් ''දිවි නැගුම'' ජාතික වැඩසටහන යටතේ 'දිවි නැගුම'' ගෘහ කර්මාන්ත පර්ශද ප්‍රවර්ධන ප්‍රදර්ශනය සංවිධානය කරනු ලබයි.

2012 වසරේදී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් පහත සඳහන් පරිදි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ විය.

| අංකය | දිස්ත්‍රික්කය | සහභාගීවූවන්ගේ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අනුරාධපුරය | 09 |
| 02 | යාපනය | 19 |
| 03 | කෑගල්ල | 125 |
| 04 | ගම්පහ | 22 |
| 05 | මොණරාගල | 05 |
| 06 | පුත්තලම. | 16 |
| 07 | **මන්නාරම** | 99 |
| 08 | නුවර | 88 |
| 09 | **හම්බන්තොට** | **352** |
| 10 | රත්නපුර | 183 |
| 11 | පොළොන්නරුව | 212 |
| 12 | මාතලේ | 43 |

| | | |
|---|---|---|
| 15 | බදුල්ල | 61 |
| 17 | ගාල්ල | 251 |
| | **එකතුව** | **1485** |

## 2.15 කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායක ආධාරක සේවා:

තාක්ෂණ සංවර්ධන සේවා මධ්‍යස්ථාන හරහා කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායක ආධාරක සේවා කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් ජාතික ව්‍යාපාර සංවර්ධනය කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට පහසුකම් සැපයීම සඳහා තාක්ෂණ සංවර්ධන සහ සේවා මධ්‍යස්ථාන පිහිටුවන ලබයි.

- නව ව්‍යාපාර නිර්මාණය කිරීම සහ ව්‍යාප්ත කිරීම.
- කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය දත්ත පද්ධතිය
- ප්‍රාදේශීය මට්ටමින් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සඳහා ව්‍යාපාරික උපදේශනය
- ව්‍යාපාර සැළැසුම් සකස් කිරීම
- මූල්‍ය සඳහා ඇති ප්‍රවේශය වැඩි දියුණු කිරීම
- සමජාතීය ව්‍යාපාර කණ්ඩායම් ස්ථාපිත කිරීම(කේන්ද්‍රය)
- පර්ශද සංවර්ධනය

# ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

## 2012 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා වූ සම්පූර්ණ ආදායම් පිළිබඳ වාර්තාව

2 වන මහල,

බටහිර කුළුන,

සෙලින්කෝ නිවස,

අංක 69, ජනාධිපති මාවත,

කොළඹ 01.

## ජාතික ව්‍යවසාය වර්ධන අධිකාරිය

**2012 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා වූ සම්පූර්ණ ආදායම් පිළිබඳ වාර්තාව**

| වැඩසටහන් සඳහා මුදල් ප්‍රදාන භාවිතය | සටහන | 2012<br>රු: | 2011<br>රු: |
|---|---|---|---|
| වර්ෂයට අදාළ ප්‍රදාන | 16 | 15,275,239 | 19,328,779 |
| වැඩසටහන් වියදම් | 9 | 15,275,239 | 19,328,779 |
| | | - | - |
| **මෙහෙයුම්** | | | |
| මහාභාණ්ඩාගාරයෙන් ලැබුණු | | 20,075,000 | 19,464,000 |
| පුණරාවර්තන වියදම් | 14 | 4,093,002 | 2,002,697 |
| රාජ්‍ය ප්‍රදාන නිදහස් කිරීම | 7 | 57,359 | 126,526 |
| **වෙනත් ආදායම්** | | | |
| **මුළු ආදායම** | | **24,225,361** | **21,593,223** |
| **පරිපාලන වියදම්** | 8 | **26,275,440** | **20,884,686** |
| **මුළු වියදම්** | | **26,275,440** | **20,884,686** |
| **වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය/ (හිඟය)** | | **(2,050,079)** | **708,537** |

| දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය | සටහන | 2012<br>රු: | 2011<br>රු: | 2011<br>ජනවාරි 01<br>රු: |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| **දේපළ,පිරියත හා උපකරණ** | 10 | 20,662,895 | 7,042,647 | 3,279,316 |
| **ජංගම වත්කම්** | | | | |
| ලැබීම් | 11 | 228,653 | - | - |
| තැන්පතු හා අත්තිකාරම් | 12 | 857,38 | 1,043,180 | 85,000 |
| කළින් ගෙවූ වියදම් | 13 | 78,561 | 84,165 | - |
| උත්සව අත්තිකාරම් | | 23,500 | 12,000 | 11,000 |
| මූල්‍ය සමානතා | | 81,509 | 1,998,625 | 1,937,087 |
| **මුළු ජංගම වත්කම්** | | **1,269,603** | **3,137,970** | **2,033,087** |
| **මුළු වත්කම්** | | **21,932,498** | **10,180,617** | **5,312,403** |
| **කොටස් ප්‍රාග්ධනය හා වගකීම්** | | | | |
| **කොටස් ප්‍රාග් ධනය** | | | | |
| එකතුවූ අතිරික්තය | | 698,248 | 2,748,327 | 2,039,791 |
| **මුළු කොටස් ප්රාග් ධනය** | | **698,248** | **2,748,327** | **2,039,791** |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| රාජ්‍ය ප්‍රදාන | 14 | 18,951,965 | 5,644,967 | 2,147,664 |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම | 15 | 199,368 | 149,027 | 102,638 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **19,151,333** | **5,793,994** | **2,250,302** |
| **ජංගම වගකීම්** | | | | |
| වැඩසටහන් සඳහා ප්‍රදාන | 16 | 38,407 | 788,646 | 592,424 |
| උපචිත වියදම් | | 2,044,510 | 849,65 | 429,887 |
| **මුළු ජංගම වගකීම්** | | **2,082,917** | **1,638,296** | **1,022,311** |
| **මුළු කොටස් ප්‍රාග්ධනය හා වගකීම්** | | **21,932,498** | **10,180,617** | **5,312,403** |

05 සිට 23 දක්වා පිටුවල සඳහන් සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන් වල ඒකාබද්ධ කොටසකි.

අධිකාරියේ මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රීලංකා ගිණුම්කරන ප්‍රමිතීන් වලට අනුකූල බවට මෙයින් සහතික කරමි.

........................

ගණකාධිකාරී

අත්සන් කළේ/

.......................................................
එන්.එම්. ෂහීඩ්
සභාපති / අධ්‍යක්ෂ ජනරාල්
මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වගකියනු ලැබේ.
අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අත්සන් කරනු ලැබුවේ,

| .......................... | ...................... |
|---|---|
| **එම්.ඒ. තාජුදීන්** | **ටී.එන්.ඔසේන්** |
| **අධ්‍යක්ෂ** | **අධ්‍යක්ෂ** |

## ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

**2012 දෙසැම්බර් මස 31 න් අවසන් වන වර්ෂය සඳහා කොටස් ප්‍රාග්ධනයේ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය**

| | සමුච්චිත අතිරික්තය | එකතුව |
|---|---|---|
| | රු: | රු: |
| **2011 ජනවාරි මස 01 දිනට ශේෂය (කළින් සඳහන් කර ඇත.)** | **(4,948,496)** | **(4,948,496)** |
| | 6,988,286 | 6,988,286 |
| **2011 ජනවාරි මස 01 දිනට ශේෂය (නැවත සඳහන් කර ඇත.)** | **2,039,791** | **2,039,791** |
| වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය | 708,537 | 708,537 |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **2,748,327** | **2,748,327** |
| **වර්ෂය සඳහා දළ හිඟය** | **(2,050,079)** | **(2,050,079)** |
| **2012 දෙසැම්බර් 31 දිනට හේෂය** | **698,248** | **698,248** |

## ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

**2012 දෙසැම්බර් මස 31 න් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | 2012 | 2011 |
|---|---|---|
| | රු: | රු: |
| **මෙහෙයුම් කටයුතුවලින් වන මුදල් ප්‍රවාහයන්** | | |
| වර්මය සඳහා ශුද්ධ අතිරික්ත/ (ඌනතාවය) | (2,050,,079) | 708,537 |
| **වෙනස් කිරීම්** | | |
| ක්ෂය වීම් | 4,427,047 | 1,517,032 |
| රාජ්‍ය ප්‍රධාන ක්‍රමක්ෂය | (4,093,002) | (2,002,697) |
| වර්ෂය සඳහා පාරිතෝෂික අය කිරීම් | 50,341 | 46,389 |
| කාරක ප්‍රාග් ධනයේ වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ප්‍රතිලාභ | **(1,665,693)** | **269,261** |
| **කාරක ප්‍රාග් ධනයේ වෙනස්වීම්** | | |
| ලැබීම් | (228,653) | - |
| තැන්පතු සහ අත්තිකාරම් | 185,800 | - 958,180 |
| පෙර ගෙවුම් වියදම් | 5,604 | (84,165) |
| උත්සව අත්තිකාරම් | (11,500) | (1,000) |
| වැඩසටහන් සඳහා ප්‍රධාන | (750,239) | 196,221 |
| උපචිත වියදම් | 1,194,860 | 419,763 |
| **මෙහෙයුම් කටයුතුවපින් ඇතිවූ මුදල්** | **(1,269,821)** | **(158,000)** |
| **ගෙවන ලද පාරිතෝෂිත** | | |
| **මෙහෙයුම් කටයුතුවලින් ඇතිවූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | **(1,269,821)** | **(158,000)** |
| ආයෝජන කටයුතු වලින් ඇතිවූ මුදල් ප්‍රවාහයන් | | |
| දේපළ පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම | (18,047,295) | (5,280,363) |
| **ආයෝජන කටයුතු වලඅදී යෝදගනු ලැබූ ශුද්ධමුදල්** | **(18,047,295)** | **(5,280,363)** |
| **මූල්‍ය සම්පාදන කටයුතුවලින් ඇතිවූ මුදල් ප්‍රවාහයන්** | | |
| රජයෙන් ලැබුනු ප්‍රධාන | 17,400,000 | 5,500,000 |
| **මූල්‍ය සම්පාදන කටයුතුවලදී භාවිතාවූ ශුද්ධ මුදල්** | **17,400,000** | **5,500,000** |
| වර්ෂය තුළදී මුදල් හා මුදල්වලට සමාන දෑ වල දළ වෙනස්වීම | **(1,917,116)** | **61,538** |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල්වලට සමාන දෑ | **1,998,625** | **1,937,087** |
| **වරෂය අවසානයේදී මුදල් හා මුදල්වලට සමාන දෑ** | **81,509** | **1,998,625** |

## ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

### 2012 දෙසැම්බර් මස 31 න් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල සටහන්

### 1. සංයුක්ත තොරතුරු:

**1.1 පොදු කරුණු:**

2006 අංක 17 දරණ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරී පණත මගින් 2006 මැයි 19 වන දින ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පිහිටුවන ලදී.

**1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් ස්වභාවය:**

රටේ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර අංශයට වැඩඩි අවධානයක් යොමු කරමින් ශ්‍රීලංකාව තුල ව්‍යාපාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම , ආධාර කිරීම, ධෛර්යමත් කිරීම සහ පහසුකම් සැපයීම සඳහා ස්ථාපිත කරන ලදී.

**1.3 මූල්‍ය වර්ෂය:**

අධිකාරියේ මූල්‍ය වාර්තා කිරීමේ කාල පරිච්ඡේදය දෙසැම්බර් මස 31න් අවසන් වේ.

**1.4 ලියාපදිංචි කාර්යාලය:**

කොළඹ 01,ජනාධිපති මාවත, අංක 69, සෙලින්කෝ නිවස, බටහිර කුළුණ දෙවන මහලේ අධිකාරියේ ලියාපදිංචි කාර්යාලය පිහිටුවා ඇත.

**මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය පවරා ඇති දිනය**

2013 ජූලි 31 වන දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව 2012 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා අධිකාරිය මූල්‍ය ප්‍රකාශය නිකුත් කිරීමට බලය ලබාදෙන ලදී.

**2. වැඩසටහන් තොරතුරු:**

2.1.1 ජාතික ව්‍යාපාර සංසදයට ව්‍යාපාරික ප්‍රජාවගේ විවිධ ස්ථරයන් අතර, වඩා යහපත් සම්බන්ධීකරණය හා සංනිවේදනය සඳහා ආයතනික ව්‍යුහයක් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ප්‍රවර්ධනය කරනු ලබයි. විවිධ පාර්ශව කරුවන් නියෝජනය කරන ඉහල මට්ටමේ තනතුරු දැන නිලධාරීනගේන ජාතික ව්‍යාපාර සංසදය සමන්විත වේ. ජාතික මට්ටමේ හඳුනාගත් ව්‍යාපාර ගැටළු සහ ව්‍යුහයේ පහළ මට්ටමේ නොවිසඳුනු ගැටළු ජාතික ව්‍යාපාර සංසදයේ දී සාකච්ඡාවට බඳුන් තෙරේ.රැස්වීම් 11 ක් පවත්වා අ ැත.

**2.1.2 දිස්ත්‍රික් ව්‍යවසාය සංසදය:**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංයුක්ත සැළැස්මට අනුව ව්‍යවසායකයන්ට ව්‍යාපාර සංවර්ධන සේවා සැපයීම සඳහා දිස්ත්‍රික්ක ව්‍යවසාය සංසද (DEF) ස්ථාපිත කිරීම එයට ඇතුලත් වේ. දිස්ත්‍රික් ව්‍යවසාය සංසද දිස්ත්‍රක්ක මට්ටමින් ස්ථාපිත කර ඇති අතර, දිස්ත්‍රික්කය තුළ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්, වාණිජ සහ වෙළඳ හෝ ව්‍යාපාර සංගම් වලින් මෙය සමන්විත වන්නේය.

**2.1.3 කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය මාර්ගෝපකරණ ග්‍රන්ථය:**

ජාතික මට්ටමේ මාර්ගෝද්ශක ග්‍රන්ථය දොරට වැඩීමේ වැඩසටහන සහ කොළඹ, මාතලේ,අනුරාධපුර, රත්නපුර, බදුල්ල සහ මඩකලපුව දිස්ත්‍රික්කවල ප්‍රාද්ශීය මට්ටමින් දොරට වැඩීමේ වැඩසටහනක් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් 2012 මුල් කාර්තුව තුළදී සම්පූර්ණ කර ඇත.

2.2 ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය:

දැනට පහත සදහන් තොරතුරු ලබාගතහැකිය.

i. මාර්ගෝපදේශක ග්‍රන්ථයේ විද්‍යුත් පිටපත
ii. ප්‍රතිපත්ති ලේඛණ සහ ප්‍රතිපත්ති සමාලෝචන ක්‍රමය
iii. ව්‍යාපාර සංවර්ධන විෂයය උගන්වනු ලබන වීඩියෝ දර්ශණ
iv. වාණිජ මණ්ඩලවලට අදාළ තොරතුරු
v. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ ව්‍යාපාර සංවර්ධනයට මැදිහත් වීම
vi. ප්‍රවෘත්ති
vii. ව්‍යාපාර සැළසුමක ආදර්ශය

**2.3 ගමට ඔබින ව්‍යාපාර වැඩසටහන:**

මෙම කරුණ අවබෝධකරගෙන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ආරම්භයේ සිටම මෙම වැදගත් අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා පියවර රාශියක් ගෙන ඇත. විශේෂයෙන් ප්‍රාදේශීය ප්රදේශවල කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අංශය ප්‍රවර්ධනය කිරීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සැළසුම්කර ඇති අතර, ග්‍රාමීය මට්ටමෙන් ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා “ගමට ඔබින ව්‍යාපාර වැඩසටහන” යනුවෙන් එය නම්කර ඇත. මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව, රටේ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අංශය දියුණු කිරීම සඳහා විශේෂ වැදගත්කමක් ලබාදී ඇත.

මෙම වැඩසටහන ප්‍රධාන සංරචක 3 කින් සමන්විත වේ.

i. දෙන ලද භූගෝලීය ප්‍රෙද්ශයක් තුළ (දිස්ත්‍රික මට්ටමින් තරඟකාරී ව්‍යාපාර අංශ සංවර්ධනය කරීම සඳහා තරඟකාරී ව්‍යාපාර අවස්ථා ගැටළු සහ යෝජනා හඳුනා ගැනීම.

II. ව්‍යාපාර ආදර්ශ සංවර්ධනය

III. වැඩසටහනේ මුල් අදියරයේදී යෝජනා කරනු ලබන අංශ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම.

**ව්‍යාපාර සැලසුම් සඳහා මුදල් යෙදවීම**

**ක්‍රියාත්මක කිරීමෙ ක්‍රමය:**




## 2.4 උපාධිධාරී ව්‍යවසායක උදානය වැඩසටහන:

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම මගින් ඔවුන්සාර්ථක ව්‍යවසායකයන් බවට සංවර්ධනය කිරීම සඳහා විශේෂ වැඩසටහන් දියත් කිරීමට සැළසුම් කර ඇත. ව්‍යවසායකත්වඅධ්‍යාපනය සහ පහසුවෙන් ලබාගතහැකි හැකියාවන් සංවර්ධනය කිරීම රෝපණය කිරීමට වඩා සුවිශේෂිත පරිශ්‍රමයක් අවශ්‍ය වේ.විශ්ව විද්‍යාලවල වෘත්තීය මාර්ගෝපදේශකත්ව ඒකකවල සහයෝගය ඇතිව ප්‍රතිලාභීන් ගේ සේවා තෝරා ගැනීම සහ පසුවිපරම් කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

ආරම්භක අදියරේදී ශ්‍රීලංකා වයඹ විශ්වවිද්‍යාලය සමග මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති වැටසටහන පියවර කීපයකින් සමන්විත වේ. විශ්ව විද්‍යාලයේ මාර්ගෝපදේශකත්ව ඒකකය විසින් විශ්ව විද්‍යා වැඩසටහන ක්‍රියාත්මක කිරීමට එකඟවී ඇත.

- **I.** දැනුවත් කිරීමේ වැඩසටහන:.
- **II.** ප්‍රතිලාභීන් තෝරා ගැනීම
- **III.** අවශ්‍යතා තක්සේරුව
- **IV.** අවශ්‍යතා තක්සේරුව පදනම්කර ගත් හැකියා සංවර්ධනය
- **V.** මූල්‍ය සහයෝගය
- **VI.** පසුවිපරම සහ ව්‍යාපාර උපදේශනය

**2.5 ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ගේ ජාතික නාමාවලියක් සකස්කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම සහ ව්‍යාපාර සංවර්ධන සේවාව ශක්තිමත් කිරීම:**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංයුක්ත සැළැස්මට අනුව, ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ගේ ජාතික නාමාවලියක් සකස්කිරීම සහ ප්‍රකාශයට පත්කිරීම ඊට ඇතුලත් වේ. ව්‍යවසායකයන් ගේ කාර්යසාධනය සඳහා සේවා සැපයීමට ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ට ප්‍රධාන කාර්යභාරයක් ඇත. විවිධාකාර කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා විවිධාකාර ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් නිරතවී සිටින අතර, ප්‍රධාන වශයෙන් අලෙවිකරණය, තාක්ෂණික සංවර්ධනය හා හුවමාරුව, මූල්‍ය, ව්‍යවසායකත්ව සංවර්ධනය, තොරතුරු තාක්ෂණය ආදියට ඔවුන් සහයෝගය දක්වති.

**පියවරයන් 5 ක් යටතේ ඉහත සඳහන් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සැළසුම් කර ඇත,**

1. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය යටතේ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම.
2. ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ගේ ජාතික නාමාවලිය සකස් කිරීම.
3. ජාතික නාමාවලිය ප්‍රකාශයට පත්කිරීම.
4. ව්‍යාවසාය සංවර්ධන සේවා සපයන්නන් පිළිබඳව අවශ්‍යතා ඇගයීමක් කිරීම.
5. ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් ශක්තිමත් කිරීම.

**2.6. ආර්ථික කලාප - ස්ථාපනය කිරීම සඳහා පවත්නා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පර්ශද නැවත සකස් කිරීම:**

සංයුක්ත සැළැස්මට අනුව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් කුඩා හා මධය පරිමාණ ව්‍යාපාර පර්ශද සහ අනෙකුත් කාර්යයන් පහත සඳහන් ප්‍රදේශවල ක්‍රියාත්මක කර ඇත.

**2.6.1 කොහු පර්ශද සංවර්ධන වැඩසටහන:**

කාර්යක්ෂමව වැඩ කිරීම පිළිබඳවත්, කොහු කර්මාන්තශාලාවල යහපත් වැඩ කිරීමේ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ විශ්‍රාම වැටුප් ක්‍රමය ප්‍රවර්ධනය කිරීමටත් වැඩමුළු 04 ක් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් පවත්වා ඇත.

| ස්ථානය | කොහු මෝල් ගණන |
|---|---|
| වෙන්නප්පුව | 25 |
| බිංගිරිය | 29 |
| කුරුණෑගල | 26 |
| **එකතුව** | **80** |

**2.6.2 මොරටුව දැව පර්ශදය - ජාත්‍යන්තර තරගකාරී ගෘහභාණ්ඩ දේශීයව සකස් කිරීම:**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් අවිධිමත් භූගෝලීය පොකුරක් වශයෙන් මොරටුව හඳුනාගෙන ඇති අතර සංවර්ධන හවුල්කරුවන්ගේ සහයෝගය ඇතිව කාර්මික ගම්මාන සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ රජය විසින් දැනටමත් ආරම්භ කර ක්‍රියාත්මක කරන සංවර්ධන කටයුතු පුළුල් කිරීම මගින් එය සංවිධානාත්මක පර්ශදයක් වශයෙන් සංවර්ධනය කිරීමට සැළසුම්කර ඇත.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් මොරටුව දැව කර්මාන්ත සංගමය හරහා ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මොරටුව දැව කර්මාන්ත සංගමයේ සහයෝගය ඇතිව ප්‍රතිලාභීන් තෝරාගනු ලැබූ අතර, ප්‍රතිලාභීන් 25 දෙනකු සඳහා ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහනක් පවත්වන ගදී. එසේම, වඩු කර්මාන්තයේ නියැලී සිටින ව්‍යවසායකයන් 25 දෙනෙකු වෙනුවෙන් යන්ත්‍ර සහ උපකරණ සපයන ලදී.

**2.6.3 අත්යන්ත්‍ර පර්ෂද- "දේශීය ඇඳුම් භාවිතා කරන සාඩම්බර පුරවැසියන් බිහිකිරීම සඳහා"**

ජාතික ව්‍යවසාය සවර්ධන අධිකාරිය විසින් අත්යන්ත්‍ර පර්ෂද සංවර්ධන වැඩසටහනේ නිරතව සිටී. ජාතික ව්‍යවසාය සවර්ධන අධිකාරිය විසින් පහත සඳහන් පරිදි සංවර්ධන වැඩසටහන් සැළසුම්කර ඇත.

1. පෞද්ගලික සහ සංස්ථාගත අංශ සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්.

2. රෙදිවියන්නන් සඳහා ව්‍යවසායකත්ව පුහුණුව (ව්‍යාපාර සැළසුම්, ගිණුම් පද්ධති සකස් කිරීම)

3. වාණිජ ව්‍යාපාර සඳහා විලාසිතා නිර්මාණය කිරීමේ විශේෂඥ උපාධිධාරීන් ප්‍රවර්ධනය කිරීම.

මොරටුව විශවවිද්‍යාලයේ සහ නිර්මාණ පිළිබඳ අධ්‍යාපන ආයතනයේ ඇඟළුම් කර්මාන්තය පිළිබඳ ඉගෙන ගන්නා උපාධිධාරීන්ට ව්‍යවසාය සංවර්ධන පුහුණුව ලබාදෙන ලදී. ඒ සඳහා පුහුණුවන්නන් 15 දෙනකු සහභාගී විය. එසේම, ඇඟළුවම් ආයතන වල සහ පෞද්ගලික අංශයේ නිරතව සිටින නිලධාරීන් සඳහා මෙම පුහුණුව ලබාදෙන ලදී.

| ස්ථානය | සහභාගීවූවන්ගේ සංඛ්‍යාව |
|---|---|
| කුරුණෑගල | 22 |
| කොළඹ | 15 |
| මාතර | 12 |
| **එකතුව** | **49** |

**2.6.4.** **ව්‍යාපාර සංවර්ධන සේවා වෙළඳ ප්‍රදර්ශණ:**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංයුක්ත සැලැස්මට අනුව (යොමු අංකය: 3.4.1), ප්‍රාදේශීය මට්ටමින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මෙහෙයුම් වැඩි දියුණු කිරීමේ අරමුණෙන් ව්‍යාපාර වෙළඳ ප්‍රදර්ශණ සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් ගේ සේවා ප්‍රදර්ශණ පැවැත්වීමට යෝජනා කරනු ලබයි. ප්‍රදේශය තුළ මෙන්ම රටතුළ ඇති ව්‍යාපාර සවර්ධන සේවා පිළිබඳ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වැඩි දෙනෙක් නොදැන සිටින අතර, ඔවුන්ට ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ගෙන් උපරිම ප්‍රතිලාභ

ලබා ගැනීමට නොහැකිවී ඇති බව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය හඳුනා ගෙන ඇත. ව්‍යවසායකයන් සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් අතර පවතින මෙම පරතරය නැති කිරීම සඳහා ශක්තිමත් බැඳීමක් සහ මැදිහත්වීමක් නිර්මාණය කලයුතුය. සංවර්ධන හැකියාවක් ඇති ව්‍යවසායකයන්ගේ ව්‍යවසායකත්ව හැකියාව ඉහළ නකංවමින් සහ තරඟකාරීත්වය වැඩි දියුණු කරමින් ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ගේ සේවාවන් උපරිම වශයෙන් භාවිතා කිරීමට කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් අතර ඇති පරතරය ව්‍යාපාර සේවා වෙළඳ ප්‍රදර්ශණ මගින් පුරවනු ඇත.

**වැඩසටහනේ අරමුණු:**

I. ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් සහ මධ්‍යම හා කුඩා පරිමාණ ව්‍යසායකයන් අතර ඇති පරතරය පිරවීම (MSMES).

II. කුඩා හා මධ්‍යම පරිමාණ සංවර්ධනය සඳහා ව්‍යාපාර ජාලයක් සංවර්ධනය කිරීම.

III. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් ගේ නිෂ්පාදන ප්‍රදේශය තුළ ප්‍රවර්ධනය කිරීම සහ අලෙවිකරන සම්බන්ධතා ස්ථාපිත කිරීම.

2012 වර්ෂයේදී ජාතික ව්‍යවසාය සවර්ධන අධිකාරිය විසින් ව්‍යාපාර සංවර්ධන සේවා ප්‍රදර්ශණ කුරුණෑගල , මඩකලපුව මන්නාරම සහ අනුරාධපුර යන දිස්ත්‍රික්කවල පවත්වා ඇත.

## 2.6.5" දැයට කිරුළ" ජාතික ප්‍රදර්ශනය- 2012/2013

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් 2012 වර්ෂයේදී අනුරාධපුරයේ දී පවත්වන ලද "දැයට කිරුළ" ප්‍රදර්ශණයට සහභාගීවිය.

2013 දැයට කිරුළ වැඩසටහන යටතේ අම්පාර, මඩකලපුව, පොළොන්නරුව දිස්ත්‍රික්කවල සංවර්ධන වැඩසටහන් ක්‍රියාතක්මක කිරීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය බලාපොරොත්තුවේ.

මෙම ජාතික වැඩසටහන සඳහා පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කිරීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සැළසුම්කර ඇත.

1. ඉහත එක් එක් දිස්ත්‍රික්කවලින් (එක් දිස්ත්‍රික්කයක් සඳහා 30 දෙනෙකු) සමජාතිය නව හෝ පවත්නා ව්‍යාපාර කණ්ඩායම් තෝරාගැනීම සහ ව්‍යාපාරික පුහුණුව( එක් දිස්ත්‍රික්කයක සඳහා එක් වැඩසටහනක්) ලබාදීම. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ අදාළ ප්‍රදේශයේ අනෙකුත් ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් මගින් තෝරා ගැනීම සිදුකෙරෙනු ඇත.

2. ස්වකීය මූල්‍ය අවශ්‍යතා සඳහා මූල්‍ය ආයතන සමඟ සම්බන්ධවීම.

3. ප්‍රදේශය තුල ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් සමඟ සහයෝගය ඇතිව සිදුකරන සේවා පසුවිපරම් කිරීම.

ප්‍රදර්ශනයේ දී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ වෙළඳකුටියක් ඉදිකිරීම සහ ස්වකීය නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම සඳහා ඉහත දක්වා ඇති ප්‍රතිලාභීන්ට (තොරාගත්) අවස්ථාව ලබාදීම. ඊට අමතරව, ප්‍රදර්ශණයේදී ස්ව කීය යන්ත්‍ර සූත්‍ර ප්‍රදර්ශණය කිරීම සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදකයන්ට අවස්ථාව ලබාදෙනු ලබාදෙයි.

### 2.6.6 ''දිවි නැගුම'' ජාතික වැඩසටහන:

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සහ සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යාපාර ස්වර්ධන අමත්‍යාංශය විසින් ''දිවි නැගුම'' ජාතික වැඩසටහන යටතේ 'දිවි නැගුම'' ගෘහ කර්මාන්ත පර්ශද ප්‍රවර්ධන ප්‍රදර්ශනය සංවිධානය කරනු ලබයි. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් මෙම ප්‍රදර්ශනය සඳහා දායකත්වය ලබාදීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියට ආරාධනයකර ඇත.

මෙම වසරේදී සාම්ප්‍රදායික කර්මාන්ත අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලැබූ සියළුම ප්‍රදර්ශන වලට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සහභාගීවී ඇත. එසේම, ''දිවි නැගුම'' ප්‍රතිලාභීන් වෙනුවෙන් පුහුණු සහ පහසුකම් සැපයීමේ වැඩසටහන් වලට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සම්බනධවී ඇත. 2012 වසරේදී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් පහත සඳහන් පරිදි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ විය.

### 2.7 තාක්ෂණික සංවර්ධන අරමුදල(TDF):

